www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සසජාශි/සසප සමුලුවට කරන ලද ප්‍රතිපදානයන්: ඩේවිඩ් නෝර්ත්

**Contributions to ISSE/SEP conference: David North**

## 2007 අප්‍රේල් 9

*පහත දැක්වෙන්නේ යුද්ධයට එරෙහිව පැවැත්වූ සසජාශි/සසප හදිසි සමුලුවේ දී ලෝසවෙඅ කර්තෘ මන්ඩල සභාපති සහ සසප (එජ) ජාතික ලේකම් ඩේවිඩ් නෝර්ත් විසින් කරන ලද ප්‍රතිපදානයයි.*

*සමුලුව පැවැත්වුනේ මාර්තු 31 සහ අප්‍රේල් 1 යන දිනයන්හි මිචිගන් හි ඈන් ආබර් හි දී වන අතර ප්‍රතිපදානයන් සිදු කෙරුනේ ප්‍රධාන යෝජනාව ("ඉරාකයේ වාඩි ලා ගැනීම නතර කරනු! ඉරානයට එරෙහිව යුද්ධයක් එපා! යුද්ධයට එරෙහිව ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයක් සඳහා!") මත කෙරුනු සාකච්ඡාව තුල දී ය.*

මෙම සමුලුව හමුවේ ඇති ප්‍රධාන කර්තව්‍යය වන්නේ ඉරාකය තුල යුද්ධයේ වර්ධනයන් සහ එහි පුලුල් අර්ථභාරය පිලිබඳව ප්‍රවේශම් සහගත තක්සේරුවක් ඇති කර ගැනීමයි. මෙම රට තුල සහ ජාත්‍යන්තර සමාජ සහ දේශපාලන අර්බුදයන්ගේ ඉදිරි වර්ධනයන් සහ යුද්ධය අතර ඇති සබඳතාව පිලිබඳ නිරවද්‍ය අවබෝධයක් මත සසජාශි හි වැඩ කටයුතු පදනම් කර ගැනීම අත්‍යවශ්‍යය.

සිව් වසරකට පෙර යුද්ධය ඇරඹෙන විට බුෂ් පරිපාලනය විසින් එය නම් කරන ලද්දේ "කම්පනය සහ ත්‍රාසය" ලෙස බැව් ඔබේ මතකයට නැගෙනවා ඇති. යුද්ධය පටන් ගන්නා විට පාලක ප්‍රභූවේ පුලුල් කොටස් තුල පැවති මායාව මෙම නම් කිරීම මගින් පිලිබිඹු කෙරින; එනම් ඉරාකීයයන් පමනක් නොව සමස්ත ලෝකයම ඇමරිකානු අධිරාජ්‍යවාදයේ අපරාජිතභාවයෙන් විස්මයට පත් කරන මිලිටරි බලයක් ප්‍රදර්ශනය කිරීමට එක්සත් ජනපදය යන බවයි. ඒ සමගම වෝල් වීදියේ සහ එක්සත් ජනපද දැවැන්ත සංගතයන්ගේ අවශ්‍යතා මත ලෝකය ප්‍රතිසංවිධානය කිරීම සඳහා එම මිලිටරි බලය සෑහේය යන මෙම මායාවේ ගිලී සිටියවුන් බොහොමයක් මාධ්‍යයන් හා ජාත්‍යන්තර දේශපාලන සංස්ථාපිතයන් තුල ද නිශ්චිතවම සිටියහ.

ආරම්භයේ සිටම යුද්ධය සම්බන්ධයෙන් සසප ට සහ ලෝසවෙඅ ට තිබුනේ වෙනත් දැක්මකි. ආරම්භක මිලිටරි සාර්ථකත්වයන් තිබිය දී අප කියා සිටියේ වැඩිකල් යාමට මත්තෙන් යටින් පවත්නා වූ අර්බුදයන් සහ ඇමරිකානු අධිරාජ්‍යවාදය භූගෝලීයව දරන්නාවූ තැනට ආවේනික වූ දුර්වලතාවන් යුද්ධය තුල ප්‍රකාශයට පත්වන වන බවයි. සිදුව ඇත්තේ එයයි. යුද්ධය ඇරැඹී සිව් වසරකට පසුව වොෂින්ටනයේ ඉරාක වික්‍රමයේ අසාර්ථකත්වය විසින් සියලු මායාවන් කීතු කර ඇත. බුෂ් පරිපාලනය තුල සහ එය වටා සුලි දමමින් කැරකෙන අර්බුදයේ විවිධ මූලයන් මෙම අධිකාරවත් මිලිටරි සහ දේශපාලන කරුනට සම්බන්ධිත ය.

1990 දී, ප්‍රථම ගල්ෆ් යුද්ධය අද්දරදී, ප්‍රථම බුෂ් පරිපාලනය විසින් "නව ලෝක පර්යාය" ක උදාව - සෝවියට් සංගමය බිඳ වැටීමත් සමග ඉතිහාසය නිමා වූවේය යන සංකල්පය- නිවේදනය කලේය. මින් මතුවට එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට තරගකරුවකු නොපවතී. ෆ්‍රැන්සිස් ෆූකයාමා ප්‍රකාශ කල පරිදි ඉතිහාසයේ නව සහ අවසාන අදියර තුල ඇමරිකානු ධනවාදයේ අනුග්‍රහය යටතේ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය ආධිපත්‍යය දරනු ඇත. වසර 15 කට පසු එම ඉදිරි දර්ශනයෙන් ඉතිරිව පවත්නේ කුමක්ද? ඉරාකය තුල අසාර්ථකත්වය මිලිටරි පරාජයක් පමනක් නොවේ. එය අති මූලික වශයෙන් මෙම ගෝලීය ඉදිරි දර්ශනයේ අසාර්ථකභාවය වන අතර එමගින් සමස්ත ඓතිහාසික යුගයක නිමාව සලකුනු කරයි.

පසුගිය 60 වසර තුල ලෝක ඉතිහාසයේ ගමන් මග සලකා බලමු. දෙවන ලෝක යුද්ධයෙන් පසු එක්සත් ජනපදය ලොව වඩාත්ම බලගතු අධිරාජ්‍යවාදී රට ලෙස මතු වූ අතර, පලමු ලෝක යුද්ධය, මහා අවපාතය, සහ දෙවන ලෝක යුද ව්‍යසනය ආදී පෙර දශක තුනේ සිද්ධීන්ගෙන් සුනු විසුනුව ගිය ගෝලීය ධනේශ්වර පද්ධතියක් යලි ගොඩ නැංවීමට සහ ප්‍රතිසංවිධානය කිරීමට එය ක්‍රියාත්මක විය. එක්සත් ජනපදයේ බලයෙන් ධනවාදය ස්ථාවර කිරීමටත් ප්‍රතිනිර්මානය කිරීමටත් නියමිතව තිබුනි.

දෙවන ලෝක යුද්ධයෙන් පසු තම භූගෝලීය මූලෝපාය ක්‍රියාත්මක කිරීමේ ලා ඇමරිකානු අධිරාජ්‍යවාදය ප්‍රධාන සාර්ථකත්වයන් සාක්ෂාත් කල බැව් පිලි ගත යුතුය. මෙහිදී කරුනු දෙකක් ක්‍රියාත්මක විය. පලමුව, එක්සත්

ජනපදය එහි සියලුම පැරැනි යුරෝපීය සහ ජපාන තරගකරුවන් අභිබවා යන දැවැන්ත ආර්ථික ආධිපත්‍යයක් භුක්ති වින්දේ ය.

ජාත්‍යන්තර මූල්‍ය පද්ධතියේ එජ ඩොලරය ඉටු කල මධ්‍යක භූමිකාව මගින් මෙම ආධිපත්‍යය සංකේන්ද්‍රිත ප්‍රකාශනයක් අත් කර ගති. එක්සත් ජනපදයේ භූගෝලීය ආධිපත්‍යය සුරක්ෂිත කිරීමේ ලා ඩොලරයේ මූල්‍යමය බලය එය සතු දැවැන්ත මිලිටරි ශක්තියට වඩා බලගතු විය.

දෙවනුව, 1945 න් පසු ගෝලීය ධනේශ්වර පද්ධතිය දේශපාලනිකව යලි ස්ථාපිත කිරීමේ ලා අධිරාජ්‍යවාදයට එරෙහි විප්ලවවාදී අභියෝගයන් රඳවා තැබීමට සහ යටපත් කිරීමට රුදුරු ලෙස කැප වූ සෝවියට් සංගමය තුල ස්ටැලින්වාදී තන්ත්‍රයේ ද්‍රෝහී පිලිවෙත් ප්‍රධාන භූමිකාවක් රග දැක්වීය. මෙම කරුනු දෙකේ අන්තර් සම්බන්ධතාවයෙන් එක්සත් ජනපදයේ අධිකාරවත් භූගෝලීය ස්ථානය සඳහා තීරනාත්මක දේශපාලන සහ ආර්ථික පදනම සම්පාදනය කෙරින.

නමුදු වොෂින්ටනය අනභියෝගී නොවීය. එහි බලයේ උපරිම අවස්ථාවේ දී පවා, තමාට අවශ්‍ය කවරක් හෝ ලගා කර ගැනීමට සහ පාලනය කිරීමට එයට තිබූ හැකියාව සීමා කරමින් ලොව පුරා මහ ජනතාවගේ අරගලයන්ගේ රූපාකාරයෙන් පැන නැගුනු දේශපාලන අභියෝගයන්ට මුහුන දීමට ඇමරිකානු අධිරාජ්‍යවාදයට සිදු විය. තවදුරටත්, 1960 ගනන් අවසානයේ දී පවා, ඇමරිකානු අධිකාරිත්වයේ ආර්ථික මුක්කු සැලකිය යුතු පරිමානයෙන් බාදනය විය. 1970 ගනන් සහ 1980 ගනන් ඇමරිකානු ධනවාදයේ අර්බුදය ගැඹුරු කල දශකයන් විය.

1991 දී සෝවියට් සංගමය බිඳ වැටීම මගින් ඇමරිකානු අධිරාජ්‍යවාදය සීතල යුද්ධයෙන් විජයග්‍රාහී ලෙස මතු වූ බවට ද නැවත යහතින් ජීවත් වීමට ලැබෙන නව ඓතිහාසික ඉඩ ප්‍රස්ථාවක් ලැබුනු බවට ද හැඟීමක් ජනිත කෙරින. එම අවස්ථාවේ, අපේම ව්‍යාපාරයෙන් හැර, ලෝක අධිරාජ්‍යවාදී පද්ධතිය තුලමත් යටින් පවත්නා අර්බුදයන්ට සහ ගැටලු වලට අවධානය යොමු වුනේ ඉතා මද වශයෙනි.

ඉදිරි දර්ශන බල පවත්වන්නේ කම්කරු ව්‍යාපාරයන්ට පමනක් නොව එය ධනේශ්වරයට ද බල පායි. ඇමරිකානු පාලක ප්‍රභූව පසු ගිය වසර 15 තුල ක්‍රියාත්මක කල පිලිවෙත් පදනම් වූයේ ගෝලීය තත්වය පිලිබඳ අති මහත් සාවද්‍ය තක්සේරුවක් මතයි. එමගින් ව්‍යසනකාරී වැරදි ගනන් බැලීම් සඳහා කොන්දේසි නිර්මානය කෙරුනු අතර ඒවා පාලක ප්‍රභූවේමත් පුලුල් කොටස් වලට දැන් වඩාත් පැහැදිලි වී ඇත. නිශ්චිතවම බුෂ් පරිපාලනයට ඩිමොක්‍රැටික් පක්ෂයෙන් එල්ල වන ප්‍රහාරයන් ගාමකය ලබන්නේ පරිපාලනයේ පොදු අරමුනු වලට ඇති විරුද්ධත්වයකින් නොවන අතර, ඒ වෙනුවට, ක්‍රියාවට නංවා දැන් නාටකීය අසමර්ථතාවයකින් නිමා වී ඇති උපායන්වලට ඇති විරුද්ධත්වයෙනි.

නමුදු ප්‍රශ්නය වන්නේ එම අසමර්ථතාවේ පල විපාක මොනවාද යන්නයි. මෙහි දී ලෝක තත්වය පිලිබඳව කෙරෙන විශ්ලේශනයක් සඳහා කෙරෙන නිරවද්‍ය ප්‍රවිශ්ඨයක ඇගවුම් අවධාරනය කිරීම වැදගත්. මම මෙහි දී ලෝක තත්වය යන්න යලිත් අවධාරනය කරනවා.

අපගේ ව්‍යාපාරය, හතර වන ජාත්‍යන්තරය, අන් සියල්ලන්ගෙන් වෙන් වන්නේ ජාතික වැදගත්කම් වලට ඉහලින් ලෝක දේශපාලනයේ අධිකාරවත් අර්ථභාරය සැලකිල්ලට ගැනීම හේතුවෙනි. තම භූගෝලීය අධිකාරිත්වය යුද්ධය තුලින් ස්ථාපිත කිරීම සඳහා ඇමරිකානු අධිරාජ්‍යවාදය ක්‍රියාවට නැංවූ මහා ව්‍යාපෘතියේ අසමර්ථතාවේ ගෝලීය ඇගවුම් කවරේද? මා සිතන්නේ ඉරාකය තුල ව්‍යසනය වැඩිකල් නොගොස් එක්සත් ජනපදය තුලත් ජාත්‍යන්තරවත් ආර්ථික හා දේශපාලන කම්පනයන්ට තුඩු දිය හැකි බැව් අප අපේක්ෂා කල යුතු බවයි. එක්සත් ජනපදය තව දුරටත් ලෝක ධනවාදයේ ස්ථාවරකාරකයා ලෙස ක්‍රියාත්මක නොවන අතර ඒ වෙනුවට එය එහි බලගතු අස්ථාවරකාරකයා බවට පත්ව ඇත.

ලෝක තත්වය පිලිබඳ ක්‍රමානුකූල අධ්‍යනයකින් වැඩ ඇරඹීම වැදගත්. වත්මන් ලෝක තත්වය පිලිබඳ ප්‍රශ්න කීපයකට යොමු වෙමු.

ඉරාකය තුල ලද අන්ත පරාජය එජ සහ යුරෝපය අතරත් එජ සහ ආසියාව අතරත් සබඳතා වලට කිනම් බලපෑම් ඇති කරයිද? රුසියාව තම මූලෝපායික අවශ්‍යතා යලි තක්සේරු කිරීමට දරන තැතෙහි ඇගවුම් මොනවාද? චීනයේ වැඩෙන බලයට එජ ප්‍රතිචාරය කුමක් විය හැකිද? චීන-ජපාන සබඳතාවන්හි ඇගවුම් මොනවාද?

ගෝලීය ගැටුමක අත්‍යසාමාන්‍ය ශක්‍යතාව අපි ලෝක පරිමානව දකින්නෙමු. ඒ සමගම කලාප අතර සහ රටවල් අතර සබඳතා විමර්ශනය කරන විට රටවල් තුල අභ්‍යන්තර පංති සබඳතා කෙරෙහි මෙම කම්පනකාරී ලෝක තත්වය කිනම් බලපෑමක් ඇති කරයිද යන්න ඔබ ඇසිය යුතුය. ලෝකයේ සෑම තැනකම අභ්‍යන්තර ගැටුම් වලින් නිරන්තරව කුපිත කෙරෙන ආතතියක්, සමාජ ගැටුමක විභව්‍යතාවක් දැකිය හැක. එක්සත් ජනපදය තුලට වඩා මෙය සත්‍ය වන අන් තැනක් නොමැත.

සැලකිල්ලට ගතයුතු තවත් සාධකයකි. 20 වන සියවස යනු සුවිසල් වශයෙන් ඇමරිකාව නැග එන බලයක් වූ

කාල පරිච්ඡේදයකි. මෙය ලෝකය පිලිබඳ ඇමරිකානුවන්ගේ අවබෝධය සහ පවත්නා සමාජ පද්ධතිය පිලිබඳ ඔවුනගේ තක්සේරුව මත ප්‍රගාඪ බලපෑමක් ඇති කලේය.

නමුදු දැන් ඇමරිකානුවන් සාක්ෂි දරමින් සිටින්නේ කුමකටද? වඩ වඩාත් පැහැදිලි වන්නේ ඇමරිකානු ධනවාදය යනු පිරිහෙමින් පවත්නා සමාජයක් බවත් එහි ගෝලීය බලපෑම ක්ෂය වෙමින් පවත්නා බවත්ය. අති මූලිකව, කිසි විටෙකත් ජනප්‍රිය නොවුනු ඉරාක යුද්ධයේ අසමර්ථතාවේ බලපෑම ව්‍යසනකාරීය. මෙම පරිහානියේ සහ අර්බුදයේ හැගීම විසින් එජ තුලමත් කොන්දේසි දෙස වඩාත් විවේචනාත්මක ආකල්පයක් ගැනීමට දිරි දෙයි.

මෙහිදී ප්‍රශ්නය වන්නේ ඉරාක ව්‍යසනය සමග එජ තුල සහ ජාත්‍යන්තරව සිදුව ඇති දේශපාලන තත්වයන්ගේ වර්ධනය පිලිබඳ අවබෝධය ලබා ගන්නේ කෙසේද යන්නයි. මැතිවරනයෙන් පසු ඩිමොක්‍රැටික් පක්ෂය බුෂ් පරිපාලනය කෙරෙහි තම වාචික විවේචනය වේගවත් කොට ඉහල නැංවූ නමුදු අවසානයේදී සිදුව ඇත්තේ සොච්චම් දෙයකි. ඩිමොක්‍රැටිකයන්ට යුද්ධය නිමා කල නොහැකි අතර එක්සත් ජනපදය තුල වැඩෙන සමාජ පීඩනයට කවර හෝ බැරෑරුම් ප්‍රතිචාරයක් සම්පාදනය කිරීමට ද, ඔවුනට අවශ්‍ය වුවද, නොහැක. ඩිමොක්‍රැටිකයන් සහ ඔවුනගේ සගයන් බලයට පැමිනියේ නම් ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ගෝලීය අවශ්‍යතා අත් හැර දැමීමට ඔවුන්ට නොහැකි වන අතර එසේ නොකරනු ද ඇත.

එජ තුල පවත්නා දැවැන්ත සමාජ අසමානතාව විසින් අනිවාර්යයෙන්ම කම්කරු පංති ව්‍යාපාරයක් පැන නංවනු ඇත. මන්දයත් මෙම අසමානතාව වෛෂයිකව ප්‍රකාශයට පත් වන්නේ සමාජ සූරාකෑමේ මට්ටම්වල දැවැන්ත ඉහල නැගීමකින් වන අතර එය දේශපාලන තත්වයේ වෙනස් වීමක් පැන නංවනු ඇත. මාක්ස්වාදයේ මූලික සත්‍යය- අවසාන විශලේෂනයේදී සමාජ ආර්ථික ක්‍රියාවලීන්ගේ භූ තල බලයන් නිර්නය වන්නේ දේශපාලනයෙනි - එජ තුල සහ ජාත්‍යන්තරව ප්‍රකාශනයක් අත් කර ගනු ඇත. සසප සහ සසජාශි වර්ධනය කරන්නාවූ දේශපාලන ඉදිරි දර්ශනයේ හා ක්‍රියා මාර්ගයේ පදනම එයයි.

ලෝක ධනේශ්වර අර්බුදයේ ඉතා ඉහල අවධිය වඩාත් ඍජුව පිලිබිඹු කෙරෙන සිද්ධීන් එජය තුල අපි පෙර දකින්නෙමු. ඉතිහාසයේ නීති අනෙක් සෑම රටකටම මෙන්ම එක්සත් ජනපදයටද වලංගුවේ. අප විසින් විස්තාරනය කරන මූලෝපාය වනාහි ජාත්‍යන්තර මූලෝපායකි. අපගේ මූලෝපාය අනුව යුද්ධයට එරෙහි වත්මන් අරගලය ජාත්‍යන්තර සමාජවාදී ක්‍රියා මාර්ගයක පදනම මත කම්කරු පංතියේ සහ තරුන තරුනියන්ගේ ජාත්‍යන්තර එකමුතුවක් ආවශ්‍යක කෙරෙන භූගෝලීය අරගලයකි.

© www.wsws.org